**පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය - 2013**

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය,සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810)අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවන් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරිම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තිය (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු.10,561 ක් වූ පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදි පර්යේෂණ ව්‍යාපෘති සඳහා මිලදී ගන්නා ලද රු. 146,893 ක් පිරිවැය වූ ප්‍රාග්ධන උපකරණයක් (Submersible Aerated Pump) ස්ථාවර වත්කම් යටතේ දැක්වීම වෙනුවට පර්යේෂණ ව්‍යාපෘති යටතේ වියදමක් ලෙස සලකා ආදායමට එරෙහිව ලියාහැර තිබුණි.

(ඇ) ලෝක ආහාර වැඩසටහන යටතේ 2011 හා 2012 වර්ෂවලදී ආයතනය වෙත පරිත්‍යාග ලෙස ලැබුණු රු. 3,325,000 ක් වූ උපකරණ 07ක් හා වටිනාකම් ඇස්තමේන්තු කර නොතිබුණු උපකරණ 05 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඉදිරිපත්කරනලද විගණකාධිපති වාර්තාව මගින් පෙන්වාදුන් රු.259,880 ක් වූ ආදායම් හා වියදම් විෂයයන් 04 ක වැරදි නිවැරදි නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ඉ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද විෂයයන් 08 කට අදාළ පිරිවැය රු.62,736,724 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේදි ප්‍රයෝජනයට ගෙන තිබූ නමුත් එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) කාලච්ඡේදයේ මෙහෙයුම් කටයුතු සඳහා දායක නොවන වර්ෂ ගණනාවක සිට භාවිතයෙන් ඉවත් කර ඇති යල් පැන ගිය එහෙත් පොත් වටිනාකම රු. 5,736,788 ක් වූ සහල් වල කළු ඇට ඉවත් කිරීමේ යන්ත්‍රය මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව එම වත්කමේ ක්ෂය රු. 430,259 ක් ආදායම් වියදම් ගිණුමට හර කර තිබුණි.

(උ) ඉකුත් වර්ෂය සඳහා වූ ගැළපීම් රු.195,560 ක් අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් කිරීම වෙනුවට ස්කන්ධ ප්‍රකාශයේ සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

(ඌ) බාහිර පාර්ශවයන් වෙත නේවාසිකාගාර කුලියට දීම හා ආහාර සැපයීම වෙනුවෙන් ලැබිය යුතු රු.588,825 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.කෙසේවුවද මේ සඳහා දරන ලද වියදම් ආයතනයේ වියදම් ලෙස සලකා තිබුණි.

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ආ) ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයට 2012 වර්ෂයේදි ණය පදනම මත ලබා දුන් රු.74,500ක් වටිනා ප්ලාස්ටික් ඇසුරුම් 125 ක් හා මහ ඉලුප්පල්ලම කෘෂි භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට ලබා දුන් රු. 19,000 ක් වටිනා ප්ලාස්ටික් ඇසුරුම් 50 ක් වෙනුවෙන් මුදල් අයකර ගැනීමට හෝ එම ඇසුරුම් ආපසු ලබා ගැනීමට හෝ ක්‍රියාකර නොතිබුණි.

(ඈ) 2000 ජුනි 30 දිනට වී අලෙවි මණ්ඩලය සතු වත්කම් හා බැරකම්, 2006 ඔක්තෝම්බර් මාසයේදි පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය වෙත නීත්‍යානුකූලව පැවරීම සිදුකර තිබුණද දීර්ඝකාලයක් තිස්සේ පැවති රු.6,133,917 ක් වූ හර ශේෂ 14 ක් හා රු.1,088,851ක් වූ බැර ශේෂ 11ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැති හා පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව ආයතනයේ විමර්ෂණ හා නිරීක්ෂණ කටයුතු සඳහා නිලධාරියෙකු පත් කර සමාලෝචිත වර්ෂය තුලදි අවස්ථා 08දි ඉන්ධන වියදම් සඳහා රු. 95,400ක් ගෙවා තිබුණි. එහෙත් එම නිලධාරියා ආයතනයේ නිරීක්ෂණ කටයුතුවල යෙදුනු බව තහවුරු කෙරෙන වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3 නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | එකතුව රු.2,169,713 ක් වූ තැන්පතු ශේෂ 08 ක් වර්ෂ 02 සිට වර්ෂ 19 දක්වා කාලයක් ගතවී ඇතත් ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ආ) | 2011 සැප්තැම්බර් 15 දිනැති අංක පීඊඩී 58(2) දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මාසික වේතනය රු.50,000 ක් ඉක්මවා තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා රු. 18,000 ක් වූ උපයන විට ගෙවීම් බදු අයකිරීම විධිමත් අනුමැතියකින් තොරව අත්හිටුවා තිබුණි. |

**2.2.7 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාසික ඉන්ධන දීමනාව හිමි නිලධාරිනියක විසින් මාසයකට අනුමත ඉන්ධන ලීටර් 170 ක් බැගින් සමාලෝචිත වර්ෂය සඳහා ඉන්ධන ලීටර් 2040 කට රු.328,270 ක දීමනාවක් ලබාගෙන තිබුණි.මෙම දීමනා පූර්ණ උපයෝජනයකින් තොරව අනුමත ඉන්ධන දීමනාවට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී රු.109,386 ක ඉන්ධන ලීටර් 767.5 ක් තම නිල වාහනයට ලබාගැනීම සඳහා 2008 ජුනි 28 දිනැති අංක පී.ඊ.ඩී /50 දරන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාර ආයතනයේ සභාපතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ආයතනය පිහිටුවීමට අදාළ ගැසට් පත්‍රයේ දැක්වෙන අරමුණු වලට පටහැනිව හා පාලක සභාවේ අනුමැතියකින් තොරව ආයතනයේ මෙහෙයුම් වලට අදාල නොවන වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 47,623 ක වියදමක් දරා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,567,327 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,893,838ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.11,673,489කින් වැඩි වී තිබුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් රු. 10,360,667 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 පර්යේෂණ ව්‍යාපෘති කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක නැවුම් එළවළු හා පළතුරු වල සිදුවන නාස්තිය අවම කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් යටතේ රු.මිලියන 2.5 ක් වටිනා ශීතාගාරයක් මිලදීගැනීමට යෝජිතව තිබුණ නමුත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් සිදුකල පර්යේෂණ ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂයේදි රු.1,179,938ක් වැයකර තිබු අතර, එම පර්යේෂණ වල ප්‍රතිඵල පුවත්පත් දැන්වීම් වල පළ කිරීම අත්පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම , පර්යේෂණ පරිසංවාද පැවැත්වීම තුලින් ප්‍රසිද්ධ කර තිබුණත් අදාළ පර්යේෂණ වල ප්‍රතිඵල පසු අස්වනු ක්ෂේත්‍රයේ භාවිතා වන බවට තහවුරු වී නොතිබුණි.

(ඇ) ආයතනය ආරම්භයේ සිටම විවිධ පර්යේෂණ ව්‍යාපෘති යටතේ නිර්මාණය කරන ලද යන්ත්‍ර සූත්‍ර වල වටිනාකම් සඳහා සුදුසු ක්‍රමයක් මඟින් පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කිරීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් හා තොග ලේඛන වල සටහන් කිරීමට පේටන්ට් බල පත්‍ර ලබාගෙන නිර්මාණ අයිතිය සුරක්ෂිත කිරීමට හා යන්ත්‍රයේ පැවැත්ම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ආයතනයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රතිලාභීන් අදාල තාක්ෂණයන් භාවිතා කිරීම පිළිබඳ ප්‍රමාණවත් දත්ත පද්ධතියක් ආයතනය විසින් නඩත්තු කර නොතිබුණි.

**4.2 හඳුනාගත් අඩුපාඩු**

ආයතනයට අයත් කේෂත්‍ර මධ්‍යස්ථානයන්හි හා නුඩ්ල්ස් ගබඩාවේ පැවති රු.1,190,814 ක් වටිනා ප්ලාස්ටික් ඇසුරුම් ඒකක 1,993 ක් හා පර්යේෂණ කටයුතු සඳහා මිළදී ගත් රු.257,708 ක තොග ඌනතාවයක් නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් නිරීක්ෂණයන් ලැබේ.

(අ) එළවළු හා පළතුරු ප්‍රවාහනයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ වසර 09 කට පෙර මිලදී ගත් රු.1,754,700 ක් වටිනා ඇසුරුම් 5,849 ක් හා 2012 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභීන් සඳහා සියයට 50 ප්‍රතිලාභී දායකත්වය මත උපකරණ බෙදා දීමේ වැඩසටහන යටතේ නිෂ්පාදනය කරන ලද රු.350,000 ක් වටිනා ජංගම වෙළඳ කුටි 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් බෙදා නොහැර ඉතිරි වී තිබුණි.

(ආ) එළවළු හා පළතුරු ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ ප්ලාස්ටික් ඇසුරුම් අලෙවියෙන් ලැබුණු රු.9,201,546 ක ආදායම එම වැඩසටහන ප්‍රචලිත කිරීම සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව ගිණුම්වල රඳවා තිබුණි.

**4.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තියට පටහැනිව ආයතනයේ සේවකයින් තිදෙනෙකු 2010 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර එම නිලධාරින්ට සමාලෝචිත වර්ෂයේදි රු.990,627 ක්ද පෙර වර්ෂ සඳහා රු.1,654,388 ක්ද ආයතනය විසින් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) 2007 ජනවාරි 24 දිනැති අංක 116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසාය සතු සම්පත් අදාල අමාත්‍යාංශවල කටයුතු සඳහා යොදා නොගත යුතු වුවත් ඊට පටහැනිව ආයතනය සතු මොටර් රථයක් 2011 වර්ෂයේදි කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. එම වාහනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.140,181 ක්ද පෙර වර්ෂ සඳහා එකතුව රු.143,256 ක්ද ආයතනය විසින් වැයකර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 153 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 111 ක් වූයෙන් එදිනට පුරප්පාඩු 42ක් පැවතුණි.

**4.6 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

---

වටිනාකම රු. 932,457 ක් වු වාහන 06 ක් අවුරුදු 03 සිට අවුරුදු 11 කටත් අධික කාලයක සිට නිශ්ක්‍රියව පවතින අතර එම වාහන අපහරණය සඳහා සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

---

**5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

---

2013 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත්ව නොතිබුණු රු. 526,533 ක භාණ්ඩ වර්ෂය තුළ මිලදී ගෙන තිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

-----------------------------------

අයවැය ලේඛනය හා තත්‍ය අගයන් අතර විචලතාවය සැසඳීමේදි වැය විෂයන් 16ක සියයට 43ක ඉක්මවීමක්ද වැය විෂයන් 9ක සියයට 82ක ඉතිරියක්ද වූයෙන් අයවැය ලේඛනය ප්‍රමාණවත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලන.**

-----------------------

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතා වරින්වර ආයතනයේ සභාපති වරයාගේ අවධානයට යොමුකරන ලදි පහත සඳහන් පද්ධති හා පාලන අඩුපාඩු කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කල යුතුව ඇත

1. ආදායම් පාලනය
2. අයවැය පාලනය
3. වාහන පාලනය
4. කාර්ය මණ්ඩල කළමනාකරණය
5. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම